# නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අපට අවශ්‍ය ඇයි?

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසකට පුරවැසි ප්‍රයත්නය
அரசியலமைப்பு மாற்றத்திற்கான பிரஜைகளின் முயற்சி
Citizens' Initiative for Constitutional Change

ලිපිනය : 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05.

දුරකථන : 011 2370803 / 4

ෆැක්ස් : 011 2370801 / 2

වෙබ් අඩවිය : www.cpalanka.org

ඊමේල් : info@cpalanka.org

# 1

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අපට අවශ්‍ය ඇයි ?

---

අපට දහසකුත් එකක් වැඩ කටයුතු ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඉන් එකක් වත් කළ හැකි ද? කීපයක් මෙසේ ය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අපට හොඳ ආහාර ලබාදිය හැකිද?
- අසනීපයක දී රෝහලකට ගෙන ගොස් ප්‍රතිකාර ලබා දීමට
- පාසලකට ගොස් ළමයින්ට ඉගැන්වීමට
- නිවසක් හදා ගැනීමට
- සුදුසු රැකියාවක් ලබාගැනීමට
- ජීවත් වීමට සුදුසු වටාපිටාවක් සැකසීමට

- ආපදාවකදී පිහිටක් ලබාදීමට
- හොර හතුරු උවදුරුවලින් රැක ගැනීමට
- අනාගත දරුවන් රැක බලාගැනීමට
- වැඩිහිටියන්ට උපස්ථාන කිරීමට
- ආබාධිතයක් රැක ගැනීමට
- පන්සලකට, පල්ලියකට ගොස් ආගම ඇදහීමට

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අපට උදව් කළ හැකි ද? "බැහැ!" යනු අපේ කෙළින් පිළිතුර වනු ඇත. එහෙත් ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, අධ්‍යාපනය, සංස්කෘතිය ආදිය සාධාරණ ලෙස ලබාගැනීමට අවශ්‍ය සංවිධානය ඇතිකළ හැකි ය. ඒ සඳහා වූ සියලු බලය ලැබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙනි. එම බලය ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට සාධාරණ අපක්ෂපාත ලෙස ආණ්ඩුව විසින් යෙදිය යුතු ය.

## එවිට එහි ප්‍රතිඵල වන්නේ කුමක්ද?

- පිළිවෙළකට හැඩ ගැසුණු සාමකාමී සමාජයක් බිහිවීම ය.
- පුද්ගලයාගේත්, ජන කොටස්වලත් අයිතිවාසිකම් ආරක්‍ෂා වීම ය.
- රටේ සම්පත් නිසි පරිදි කළමනාකරණය වීමෙන් එයින් සියලු දෙනාටම උපරිම ප්‍රයෝජන ලැබීම ය.
- රටේ ආර්ථිකය සමග ජන ජීවිතය යහපත් වීමට ය.

## අනෙක් අතට

- පාලකයන්ගේ හිතුවක්කාර ක්‍රියාවලින් පොදු ජනයා ආරක්‍ෂාව ලබති.
- ශරීරයට, ජීවිතයට හානි කිරීම වළකී.
- පොදු ජන යහපත වෙනුවට පුද්ගලික වාසි ගන්නා දූෂකයන්ට එරෙහිව ක්‍රියා කිරීමට පුරවැසියා පෙළඹේ.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථිර කළ යුතු දෙයක් ඇත.

- එනම් රාජ්‍යය ආණ්ඩුවට අයිති වස්තුවක් නොව, පොදු මහජනයාට අයිති සම්පතක් බව ය.

- රාජ්‍ය බලය ආණ්ඩුවට අයිති ආයුධයක් නොව දේශයේ සියළු ජනයාට අයිති මෙවලමක් බව ය.

දේශපාලන බලය භාවිතා කිරීමේ දී ව්‍යවස්ථාව ඒ සම්බන්ධ මූලික රෙගුලාසි දක්වයි. බලය ලැබෙන මාර්ගය, බලය මාරු කිරීම, ජනතාවට වගකීම සම්බන්ධයෙනි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අත්තනෝමතික පාලනයේ අනෙක් පැත්ත නියෝජනය කරයි. ප්‍රජා පීඩකයාට තමන්ම නීතිය බවට පත්වීම ව්‍යවස්ථාවෙන් වැළැක්විය යුතු ය.

සියලු බලතල ඇති පාලකයකු බිහිවීම, පාලකයකුට යටත් පාර්ලිමේන්තුවක් ඇතිවීම,

හමුදා පාලනයක් ඇතිවීම ව්‍යවස්ථාවෙන් ම අවහිර කළ යුතු ය. බලතල දරන සියලු පාලකයන් මහජනතාවට වගකීමට බැඳී සිටින බව ව්‍යවස්ථාවෙන් තහවුරු විය යුතු ය.

ඉහත සඳහන් කරුණු නිසා අපට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අනිවාර්යයෙන් ම අවශ්‍යයි.

## 2

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු කුමක්ද?

හැම රටකම රාජ්‍යයක් තිබේ. ඒ රාජ්‍යය කරගෙන යාමට ආණ්ඩුවක් පත්වේ. ආණ්ඩුව ක්‍රියාත්මක කළ යුතු ප්‍රතිපත්ති, ක්‍රියාත්මක කරන ආකාරය හා ඒ සඳහා වූ ආයතන ආදිය විස්තර කරන අතර ම අනෙක් අතට ජනතාවගේ අයිතිවාසිකම් දක්වෙන ලේඛණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙයි. එය රටේ ඉහළම නීතිය නිසා වෙනස් කළ හැකි වන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් හා ජනමත විචාරණයකින් ය. එම මූලික නීතිය ක්‍රියාත්මක කිරීමට නීතිමය හා දේශපාලනමය අණ පණත් රෙගුලාසි බොහෝ ගණනක් සම්මත කර ගැනේ.

## එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිපැදිය යුත්තේ කවුරුද?

සියළු දෙනාම ය. නීති හදන ආයතන ඇතුළුව පාලකයන්, නිලධාරීන්, වැසියන් ඇතුළු සියළු දෙනා ම ය.

- ආණ්ඩුවේ ආයතන, පුරවැසි අයිතිවාසිකම්, දේශපාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන ආකාරය එහි සඳහන් වේ.
- එම ක්‍රියාකාරිත්වය සඳහා පුළුල් ජනතා පිළිගැනීමක් ලබාගැනීමෙන් නීත්‍යානුකූලභාවය ලබා ගැනේ.
- නියෝජනය වීම හා මානව අයිතිවාසිකම් මගින් අන්තර්ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වේ.
- එයින් රට ඇතුලේ සිටින අය කවුරුද? රටේ නොවන අය කවුරුද කියා විස්තර වේ.

- දේශසීමාව, පුරවැසිභාවය මගින් දේශපාලන ජන කොටස හැඳින්වේ.
- රටේ පරමාධිපත්‍ය බලය ඇත්තේ කවුරුන්ටදැයි එහි පැවසේ. බොහෝවිට ජනතාවට බව පිළිගැනේ.
- පාලකයන්ගේ බලතලත්, එහි ස්වභාවය, මූලික ප්‍රතිපත්ති, පොදු අපේක්ෂාවන් සඳහන් වේ.
- අපේකම, අපේ සාරධර්ම දක්වෙන සංකේත සඳහන් වේ. එනම් : ජාතික කොඩිය, ජාතික ගීය ආදියයි.
- පොදු ගුණ දහම් ප්‍රකාශ වේ. එක්සත්භාවය, අන්‍යොන්‍ය මිත්‍රත්වය, සමානාත්මතාවය ආදියයි.
- පුරවැසියන්ගේ අයිතිවාසිකම් හා යුතුකම් සඳහන් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය සහ එය ක්‍රියාත්මක වන ආකාරය සඳහන් වේ.

- ඒ සමග ම ඒ අයිතිවාසිකම්වලට ඇති සීමාවන් ද දක්වේ.

- ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක තිබිය යුතු සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කරන බව පළවේ. උදාහරණ : සිතීම, ප්‍රකාශනය, රැස්වීම් සංගම් පැවැත්වීමේ නිදහස, නීතියේ නිසි ක්‍රියා පටිපාටිය, නීතියට පටහැනිව සිරභාරයට ගැනීම, නීති විරෝධී දඬුවම්වලින් නිදහස, සමාජ, ආර්ථික, සංස්කෘතික අයිතිවාසිකම්, සමහර අයිතිවාසිකම් පුරවැසි නොවන අයටත් ඇති බව එනම්, වද හිංසාවලින් නිදහස.

- ජනතාවගේ දේශපාලන ක්‍රියාකාරිත්වයට අවශ්‍ය නිදහස ආරක්ෂා කිරීම, රජයේ ආයතන එහි ක්‍රියාකාරිත්වය, බලතල දක්වීම, නීති හැදීමේ හා ක්‍රියාත්මක කිරීමේ ආකාරය, අධිකරණ ක්‍රියාමාර්ග ගැන ද සඳහන් වේ. දේශපාලන

අවංකභාවය පෙන්වන මැතිවරණ ක්‍රමය, එම කොමිසමේ විස්තර වේ. බලය භාවිතා කරන අයගේ අවංකභාවය, වගවීම සොයා බලන, විගණක ක්‍රියාකාරිත්වය දැක්වේ. මානව අයිතිවාසිකම් කොමිසම, ඔම්බුඩ්ස්මන් අයිතිවාසිකම් රකින හැටි සඳහන් වේ. බලය අනිසි ලෙස යොදන අය ඉවත් කරන හැටි දැක්වේ. උදා : දෝෂාභියෝග හා වෙනත් ක්‍රම

- ඉතා වැදගත් කොටසක් වන්නේ බලය බෙදී යන ආකාරය සඳහන් කිරීම ය. පළාත්වලට, ප්‍රදේශවලට බලය පැවරෙන හැටි විස්තර වේ. එනම් පළාත් සභා, පළාත් පාලන ආයතනවලටයි.

- භාෂාව, ජනවර්ගය, සංස්කෘතිය අනුව ප්‍රදේශ ඇතිවිය හැකි ය.

- රාජ්‍ය භාෂාව සම්බන්ධ ගැටලු විසඳන ආකාරය විශේෂ සමාජ ආර්ථික සංවර්ධන ඉලක්ක ගැන සඳහන් විය හැකි ය.

## ව්‍යවස්ථාව නීති ලේඛණයක් වශයෙන්

යුක්තිය ඉටු කිරීමට බලය යොදන ආකාරය කියවේ. බලය යෙදිය යුත්තේ එහි සඳහන් ආකාරයටයි. එනම් කාටත් පෙනෙන ලෙසත්, පුද්ගලයාට වඩා නීතිය ගරු කරන ලෙසත් ය.

## ව්‍යවස්ථාව සමාජ ප්‍රකාශනයක් වශයෙන්

සමාජය හැඩගස්වන ආකාරය දක්වයි. සාරධර්ම සමග පරමාර්ථ ද ජනතාවගේ අභිලාෂයන් ද සඳහන් වේ. පූර්විකාව, සංඥාපනය, ප්‍රතිපත්ති හා මූලධර්ම, ආදර්ශ පාඨ, දිවුරුම් දීම්වලදී දක්වේ. සමාජ, ආර්ථික, සංස්කෘතික ප්‍රතිපත්ති, අධ්‍යාපනය, සෞඛ්‍ය, භාෂා භාවිතය ආදියෙන් ඒ බව ප්‍රකාශ වේ.

## ව්‍යවස්ථාව දේශපාලන ගිවිසුමක් වශයෙන්

ඉහළම බලය සහ තීරණ ගන්නා ආයතන හැඳින්වේ. බලය බෙදා හදාගෙන තීරණ ගත

යුතු හැටි ද, දිගටම දේශපාලන අරගලය පවතින හැටි ද දක්වේ. එනම් විපක්ෂය මගින් හා දේශපාලන පක්ෂ මගිනි.

රාජ්‍ය ආයතන හා පාර්ලිමේන්තුව, විධායකය, උසාවි, රාජ්‍ය නායකයා, ප්‍රාදේශීය ආණ්ඩු, ස්වාධීන කොමිෂන් සභා සහ ඒවා අතර සබඳතා විස්තර වේ.

## 3

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අඩංගු විය යුතු දේ

ව්‍යවස්ථාව පෙළගැස්වීමේ දී පහත සඳහන් මූලිකාංග ඇතුළත් වේ.

1. පූර්විකාව

   ආණ්ඩුකරණයේ දී ඉටුකරගත යුතු ඉතා පුළුල් පරමාර්ථයන් සහ ඉලක්කයන් දක්වෙන ප්‍රකාශනයකි. සමහර විට වැදගත් ඓතිහාසික සිදුවීම්, ජාතියක් වශයෙන් තිබිය යුතු අනන්‍යතා හා සාරධර්ම ගැන එහි සඳහන් වේ.

2. පූර්වාංග සමූහය

   මුලින්ම පැවසිය යුතු දේ එනම්, පරමාධිපත්‍ය භාවය හෙවත් රටක ප්‍රධාන

වන්නේ කවුරුන්ද යනුයි. (ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවන්හි ජනතාව බව දැක්වේ) රාජ්‍යයේ නම ද, දේශසීමාව ද සඳහන් වේ. පුරවැසිභාවය හා ඡන්ද බලය ගැන කියවේ. රාජ්‍යයේ දෘෂ්ඨිවාදය සාරධර්ම සහ පරමාර්ථ ගැන සඳහන් විය යුතු ය.

3. මූලික අයිතිවාසිකම්

ලැයිස්තුවක් වශයෙන් තිබිය යුතු ය. ඒවා භාවිතා කළ හැකි ආකාරය, ඒවා ක්‍රියාත්මක වන හැටි, ඒවාට පණවන හා හදිසි අවස්ථාවන් හි දී අත්හිටුවන ආකාරය සඳහන් කළ යුතු ය.

4. සමාජ, ආර්ථික අයිතිවාසිකම් හා ප්‍රතිපත්ති නිර්දේශ

සියළු දෙනාගේ ම ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, අධ්‍යාපන, සංස්කෘතික අවශ්‍යතා සාධාරණ ලෙස සපුරාලීම ගැන සඳහන් වේ.

5. පාර්ලිමේන්තුව හෙවත් ව්‍යවස්ථාදායකය

පාර්ලිමේන්තුව හැදෙන හැටි, එහි සංයුතිය, වගකීම් හා යුතුකම්, වරප්‍රසාද, ක්‍රියාපටිපාටිය ආදිය දැක්වේ.

6. රාජ්‍ය නායකයා කවරේද?

ඔහු තෝරාගන්නා ආකාරය, ඔහුගේ බලතල, ධූර කාලය ආදිය සඳහන් වේ.

7. ආණ්ඩුව

ආණ්ඩුව හැදෙන ආකාරය වගකීම් හා බලතල ගැන විස්තර වේ.

8. අධිකරණය

උසාවි ක්‍රමය, විනිසුරුවන් පත් කිරීම, අධිකරණයේ ස්වාධීනත්වය, නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු විස්තර වේ.

9. ප්‍රාදේශීය ආණ්ඩු

පළාත් සභා හා පළාත් පාලන ආයතන බලතල පිළිබඳ විස්තර වේ.

10. ජනමත විචාරණ පැවැත්වෙන අවස්ථා සහ පැවැත්වෙන ආකාරය සඳහන් වේ.

11. මැතිවරණ කොමිසම, ඔම්බුඩ්ස්මන්, විගණක ආයතන කළ යුතු කාර්යයන් දැක්වේ.

12. ආරක්ෂක කටයුතු

හමුදා කටයුතු හෝ හමුදාවල පැණවෙන සීමාවන් සඳහන් කරයි.

13. විශේෂ කණ්ඩායම් ගැන, භාෂා නීති, විශේෂ ආයතන දැක්වේ.

14. සංශෝධන ක්‍රියා පටිපාටිය, ක්‍රියාත්මක විය යුතු කාල සීමාව, අන්තර්කාලීන නීති රීති දැක්වේ.

සමහර කරුණු කෙළින් ම, ව්‍යවස්ථාවේ සඳහන් නොවුව ද, ඒවා ව්‍යවස්ථානුකූල නියෝග තරම්ම බලවත් විය හැකි ය. උදාහරණ කීපයක් මෙසේ ය.

1. මැතිවරණ නීති

2. දේශපාලන පක්ෂවල විය හියදම්

3. විනිසුරුවන් පත් කිරීම පිළිබඳ නීති

4. උසාවි සංවිධානය

5. අන්තර්ජාතික ගිවිසුම් හා සම්මුති

6. පාර්ලිමේන්තු ස්ථාවර නියෝග

7. අධිකරණ තීන්දු

ඒ ව්‍යවස්ථාවක පොදුවේ අන්තර්ගත වන කරුණු ය. ඊට අමතරව අපේ රටේ අළුත් ව්‍යවස්ථාවක් සම්මත වන්නේ නම්, පහත සඳහන් ක්ෂේත්‍ර ද පුළුල් විය යුතුයැයි අදහස් කරමු.

අ. ජනාධිපති විධායක බලය ඉවත් වී පාර්ලිමේන්තු විධායක ක්‍රමයක් ඇතිවිය යුතු ය. ස්වාධීන කොමිෂන් සභා පාර්ලිමේන්තුවට වග කියන තත්ත්වයට පත්විය යුතු ය.

ආ. ජාතික සමගියට හේතුවන, බලය බෙදා හදාගැනීමේ අර්ථවත් ක්‍රමයක් ඇතිකළ යුතු ය

ඇ. මනාප ක්‍රමය නැති නව මැතිවරණ ක්‍රමයක් ඇතිකළ යුතු ය.

ඈ. මානව අයිතිවාසිකම් වඩා ශක්තිමත් වන නව සංශෝධන හඳුන්වා දිය යුතු ය.

# 4

# නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැන මහජනයා අදහස් දැක්විය යුත්තේ කෙසේද?

පොදු මහජනයා තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියවා තිබිය යුතුද? ඒ කියවා තිබීම හෝ ළඟ තබාගැනීම අත්‍යාවශ්‍ය දෙයක් නොවේ. එය අධ්‍යයනය කළයුතු අය එසේ කළාට කමක් නැත.

එහෙත් අවශ්‍ය වන්නේ අපට යහපත් ජීවිතයක් ගත කිරීමට එය උපකාර වන බව දැන සිටීම ය. එය හරියට ක්‍රියාත්මක වන්නේ නම් ජීවිතය පහසු ය. වැරදියට ක්‍රියාත්මක වන්නේ නම් හෝ ක්‍රියාත්මක නොවන්නේ නම් වැඩි දෙනෙකුට අයහපතකි. අනාගත

පරපුරට ද විපතකි. අප දැන සිටිය යුත්තේ ඒ ටික ය.

## ඒ ටික අප දැන ගන්නේ කෙසේ ද?

රට පුරා ම විවිධ ප්‍රශ්න ගැන උද්ඝෝෂණ පවතී. වී මිල, නිවාස ප්‍රශ්න, සෞඛ්‍ය ගැටළු, අධ්‍යාපන අඩුපාඩු, වැටුප් විෂමතා, පාලම්, පාරවල් කැඩීයාම්, සොර සතුරු උවදුරු, දරුවන් දූෂණය වීම්, අලි ගැටුම්, වතුර ප්‍රශ්න, පරිසර හානි ආදී විවිධ කරුණු ගැන මිනිස්සු පාරට බැස උද්ඝෝෂණ කරති. සාමකාමී විරෝධතා දක්වති.

ඔවුන් එසේ කරන්නේ ව්‍යවස්ථාව කියවා දැනගෙන නොවේ. ව්‍යවස්ථාවට අනුව සිදුවිය යුතු දේ හරියට සිදු නොවන නිසා ය. ව්‍යවස්ථාව නිසි පරිදි අඩු නැතුව ක්‍රියාත්මක කිරීම ආණ්ඩුවේ වගකීම ය. විරෝධතා දැක්වෙන්නේ එම වගකීම හරියට ඉටු නොවන නිසා ය. එහෙයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන අදහස් දැක්වීමට ඔබත්

ජනතාවගේ පොදු අවශ්‍යතා ගැන අදහස් දැක්විය යුතු ය.

## අදහස් දක්වන්නේ කෙසේද?

රැස්වීම්, සාකච්ඡා, සම්භාෂණ, විරෝධතා, උපවාස, පෙළපාලි, රඟදැක්වීම්, සංදර්ශන, ලිපි ලේඛණ, පෝස්ටර්, බැනර්, පත්‍රිකා, නාට්‍ය ආදි ක්‍රම උපයෝගී වෙයි. එවැන්නක් බලා සිටීම පවා වැදගත් ය.

එයින් පොදු මානව අයිතිවාසිකම් උදෙසා සහාය වීම, සහභාගී වීම ව්‍යවස්ථාව ගැන අදහස් දැක්වීමකි.

ඊට අමතරව ජනමාධ්‍ය මගින් වෙනත් සන්නිවේදන ක්‍රම මගින් අදහස් ලබාගත හැකි ය. ව්‍යවස්ථාව ගොඩනැගීම අද ලෝක විෂයක් බවට පත්ව ඇත. හැම රටකම පාහේ ව්‍යවස්ථා බහුජනහිතකාමී කිරීමට ලෝක ජනතාව අද වැඩි උනන්දුවක් දක්වති. අපි ද එහි කොටසක් වෙමු.

රටේ කලින් තිබුණු ගැටළු තවමත් පවතින්නේ නම් හෝ අළුත් ගැටළු මතුවන්නේ නම් හෝ එයින් අදහස් වන්නේ ව්‍යවස්ථාව අළුත් කළයුතු බව ය. අනෙක් අතට එය ක්‍රියාත්මක කරවන්නේ පරණ මිනිසුන් නොවන්නේ නම් ඔවුන් ගතිගුණ තිබෙන අළුත් මිනිසුන් බව ය.

එහෙයින් අළුත් ව්‍යවස්ථාවක් ගැන අපගේ අදහස් අත්‍යවශ්‍ය ය. එහෙත් එය පරණ එකම වෙනත් වචනවලින් ලිවීමක් නොවේ. අපට වඩා යම් යහපත් ජීවිතයක් ලැබිමට ක්‍රියාත්මක වන නීති හා නීති භාවිතයක් ලැබීම ගැන ය.

ව්‍යවස්ථාව හැදීම යනුවෙන් සාමාන්‍ය මිනිසුන් අදහස් කරන්නේ සාමාන්‍ය නීතියක් හැදීමක් නොවේ. එහි පරමාර්ථය හා ස්වභාවය විය යුත්තේ පොදු ජනහිතකාමී බව ය. පොදු ජනයා ව්‍යවස්ථාව ගැන දැන සිටිය යුත්තේ ඒ ගැන නිර්මාණය වන නීතිරීති නොව එහි පරමාර්ථ සහ ස්වභාවයයි.

# 5

# ශ්‍රී ලංකාවට අළුත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍ය මක් නිසාද?

- රට ඇතුළත සෑම ප්‍රශ්නයක් ම උග්‍ර වී සමාජය පිරිහීමට ගියේ පාලක පිරිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත්, තවත් නිතිත් ප්‍රයෝජනයට ගනිමින් ජනාධිපති බලතල වැඩිකර ගැනීමෙනි.
- තනි පුද්ගල බලයක් ගොඩනැගෙන ව්‍යවස්ථාවක් තිබිය යුතු නැත. පුරවැසියා ගොඩනැගීම පරමාර්ථය විය යුතුය.
- ව්‍යවස්ථාවේ ජාතීන් හෝ ආගම්වලට හෝ සුළුතර කොටසකට අඩු හෝ වැඩි සැලකිලි දක්වෙන වගන්ති තිබිය යුතු නැත. එම වෙනස්කොට සැලකීම

තිස් අවුරුදු යුද්ධයකට ප්‍රබල හේතුවක් විය. යළිත් යුද්ධයක් ඇති නොවීමට ව්‍යවස්ථාව අරමුණු කළ යුතු ය.

- ඒ සමග අර්ථවත් ලෙස බලය බෙදාගැනීමේ ක්‍රමවේදයක් ඇති කිරීමෙන් වෙනස්කම් සහිතව අප සියලු දෙනාටම එනම් සිංහල, දෙමළ මුස්ලිම් සහ අනෙක් අයට සාමකාමීව ජීවත් වීමට මග සැලසිය යුතු ය.
- ජාති, ආගම් භේද ගැටුම් යොදාගෙන මැතිවරණ ජය ගැනීමට ඉඩ නැතිවන සේ නව මැතිවරණ ක්‍රමයක් නීතිගත කළ යුතු ය.
- රාජ්‍ය බලය කැටිකර ගැනීම සමග එක් බලවතෙකු පහළ වීමෙන් රටේ සියළු ජනතාවගේ මානව අයිතිවාසිකම් උල්ලංඝණය විය. අන්තර්ජාතික සම්මුති උල්ලංඝණය කළ නොහැකි වන සේ

එම අයිතිවාසිකම් අහිමි නොවන සේත්, අළුත් නීති හඳුන්වා දිය යුතු ය.

- ත්‍රස්තවාදය වැළැක්වීමේ නීති නිසාත්, පොලිස් ආඥා පණත නිසාත්, මානව අයිතිවාසිකම් කඩ නොවන බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රතිපාදන සැලැස්විය යුතු ය.
- සුළුතර කොටස් ස්ත්‍රීන්, ළමයින්, ආබාධිත වූවන්ගේ සහ වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීමට විශේෂ ප්‍රතිපාදන තිබිය යුතු ය.
- ආරක්ෂක තීන්දු වශයෙන් ඕනෑම තීන්දුවක් ගැනීමේ ඉඩකඩ නොතිබිය යුතු ය. ආරක්ෂාවේ නාමයෙන් මිනිසුන්ට උන්හිටි තැන් අහිමි කිරීම, රජයේ ඉඩම් තමන්ගේ ව්‍යාපාර සඳහා යෙදීමට තිබුණු ඉඩ අළුත් ව්‍යවස්ථාවක නොතිබිය යුතු ය.

- **පවතින නීති සහ වැඩි ඡන්දය මිනිසුන්ට නිසා පීඩාවන අයුරින් භාවිතා කිරීමටත්, අර්ථකථනය කිරීමත් වළක්වන ක්‍රියා පටිපාටි ඇතුළත් විය යුතු ය. ව්‍යවස්ථාවේ කොටස් ක්‍රියාත්මක නොකර සිටිය නොහැකි විය යුතු ය.**

---


**සම්පාදක**

එස්. ජී. පුංචිහේවා

**කම්ටු සාමාජික මණ්ඩලය**

මහාචාර්ය ජයන්ත සෙනෙවිරත්න
රෝහණ හෙට්ටිආරච්චි
ආචාර්ය ජෙහාන් පෙරේරා
ක්‍රිස්ටීන් පෙරේරා
ශාන් විජේතුංග
නන්දන වීරරත්න
මහින්ද රත්නායක
විශාකා ධර්මදාස
කෞෂාල්‍යා කුමාරසිංහ
පීටර් රසල්
නඩේෂන් සුරේෂ්
ප්‍රභාත් කුමාර
මනෝරි කලුගම්පිටිය
ප්‍රබෝද චින්තක
ලූවී ගනේෂදාසන්
ලහිරු කිතලගම
ප්‍රියදර්ශනී ආරියරත්න